# නිවේදනයයි

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත) තරඟ විභාගය 2021(2024)

අංක 2237 හා 2021.07.16 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද බඳවා ගැනීමේ නිවේදනය අනුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් 2023.07.29 දින පවත්වන ලද උක්ත තරඟ විභාගයේ ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරුවලට බඳවා ගැනීම සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට හා වාචික සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 147 දෙනෙකුගේ නම් ඇතුළත් නාම ලේඛනය ප්‍රකාශයට පත් කරනු ලැබේ. ඒ අනුව, පහත කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

i. මෙම තරඟ විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ සාමාන්‍ය සේවක සඛ්‍යාවේ පුරප්පාඩු 113 ක් පිරවීමට කටයුතු කරනු ලැබේ.

ii. බඳවා ගැනීමේ නිවේදනයේ 10.2 (ආ) හි 1 (i) ඡේදයේ සඳහන් පරිදි බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන බැවින්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද උක්ත තරඟ විභාගයේ පොදු කොටසේ සහ සේවා විශේෂිත කොටසේ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ඇති අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත අයදුම්කරුවන් 147 දෙනෙකුගේ (එකසිය හතලිස් හතක්) නාම ලේඛනයක් මෙහි දක්වා ඇත.

iii. මෙම ලේඛනයේ නම් සඳහන් අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ඒ සඳහා වූ සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපි ඉදිරියේ දී එම අයදුම්කරුවන් වෙත යොමු කරනු ලැබේ.

iv. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය, බඳවා ගැනීමේ ගැසට් නිවේදනය ප්‍රකාරව පවත්වනු ලබන අතර, ඒ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පමණක් වාචික සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි.

v. ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලැබීම හෝ සාමාන්‍ය හා වාචික සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම විවෘත පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත්වීම් ලැබීමට සුදුසුකමක් නොවනු ඇත.

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
2024.09.03